# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1614/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 23/12/2023<br>පැය1320 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. 2023.12.22 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 33,801 | 130 | ගෑස් සිලින්ඩර් 01<br>ගෑස් ලිප් 01<br>යකඩ බැරල් 01<br>තඹ දඟර01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2023.12.22 වන දින රාත්‍රී කාලයේ පිළියන්දල පොලිස් වසමේ දී පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පිළියන්දල වෙළඳසැල අසල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලි ග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පිළියන්දල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන බටකැත්තර පිළියන්දල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පිළියන්දල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. නීති විරෝධි මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරකම් මැඩලීමේ ඒ්කකය.**

2023.12.22 වන දින උදෑසන කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ වැල්ලම්පිටිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මැඩලීමේ ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත් පෙති 600 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන වේරගොඩැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුගොඩ කඳවුර.**

2023.12.22 වන දින උදෑසන කාලයේ දෙහිඕවිට පොලිස් වසමේ දී පොලිස් විශේෂ කාර්ය බලකා පුගොඩ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන දෙහිඕවිට පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන දෙහිඕවිට, ගාසල් වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. දෙහිඕවිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුර.**

2023.12.22 වන දින උදෑසන කාලයේ හම්බන්තොට පොලිස් වසමේ දී පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හම්බන්තොට පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වු බඳගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. හම්බන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. වියළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ.**

2023.12.22 වන දින සවස් කාලයේ මඩොල්සිම පොලිස් වසමේ දී පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මඩුගස්තලාව උතුර, පස්සර ප්‍රද්ශයේදී වැටලීමක් සිදු කර **වියළි ගංජා කිලෝ ග්‍රෑම් 04, ග්‍රෑම් 600 සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මඩොල්සිම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන මඩුගස්තලාව උතුර, පස්සර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මඩොල්සිම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**